**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්වවිද්‍යාලය**
உண்ணாட்டு மருத்துவக் கல்வி நிறுவகம்
கொழும்புப் பல்கலைக்கழகம்
**Institute of Indigenous Medicine**
**University of Colombo**

**රාජගිරිය, ශ්‍රී ලංකාව**
ராஜகிரிய, இலங்கை
**Rajagiriya, Sri Lanka**
**දුරකථන අංක: / Telephone No:** + 94 112694308, + 94 112692385

මගේ අංකය - IIM/SW/03 දිනය - 2021.01.13

2013/2014 අධ්‍යයන කණ්ඩායම (ආයුර්වේද)
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

**<u>අවසන් වසර පළමු සමාසික ලිඛිත හා ප්‍රායෝගික විභාග සම්බන්ධයෙනි</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමුකරන ලද 2021.01.12 දිනැති ලිපිය හා බැඳේ.

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අවසන් වසර ඉගෙනුම ලබන 2013/2014 අධ්‍යයන කණ්ඩායම සඳහා 2020.12.15 දිනැතිව පැවැත්වීමට නියමිතව තිබූ අවසන් වසර පළමු සමාසික ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය ඔබගේ ඉල්ලීම පරිදි 2021.01.18 දින දක්වා කල්දමන ලදී. 2021.01.07 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය සමග පැවැති රැස්වීමේදීද මේ බව තහවුරු කරන ලද අතර ඒ සඳහා සිසුන්ගේ එකඟතාවය පළ කරන ලදී.

කෙසේ නමුත් ඉහත විභාගය නැවත කල්දැමීම සම්බන්ධයෙන් සිසුන් කරන ලද ඉල්ලීම 2021.01.12 වන දින පැවැති කළමනාකාර මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කළ අතර සියළුම විභාග අතුරු විධිවිධාන (By-Laws) වලට අනුකූලව පැවැත්විය යුතු බවට තීරණය කරන ලදී. විභාග සඳහා සහභාගී නොවන සිසුන් පිළිබඳව පවතින විභාග අතුරු විධිවිධාන (By-Laws) පරිදි කටයුතු කරනු ඇත. එබැවින් සියළුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදවලට අනුගතව හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ උපදෙස් යටතේ අවසන් වසර ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු පැවැත්වීම සඳහා ආයතනය විසින් අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම මේ වනවිටත් සැලසුම් කර තිබේ. තවද, ශිෂ්‍ය නේවාසිකාගාර පහසුකම් හිමි සිසුන්ට 2021.01.14 වන දින සිට නේවාසිකාගාරවලට පැමිණිය හැකිය.

තවද, අවසන් වසර විභාගය පැවැත්වීම සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන මෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් උපදෙස් ලබාදී ඇති බවද මෙයින් දන්වා සිටිමි.

**ඒ අනුව අවසන් වසර පළමු සමාසික විභාගය දැනට තීරණය කර ඇති පරිදි 2021.01.18 දින සිට පවත්වනු ලබන බව දැනුම් දෙමි.**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ. පරණගම
අධ්‍යක්ෂ

**Director**
**2861399**
**2697175**
**Fax : 2697175**
**E-mail: director@iim.cmb.ac.lk**

**Deputy Registrar**
**2697772**
**Fax : 2697772**

**Deputy Bursar**
**2689153**
**Fax: 2689153**

**Senior Assistant Registrar**
**5679709**

**Assistant Registrar**
**2687063**